## රිදී හා තඹ පදක්කම් දිනා ගනියි



ස්ප්‍රිංවේල් හි වාසය කරන **මැණිකේ බන්ඩාරනායක** ඇයගේ ක්‍රීඩා ජීවිතය ආරම්භ කලේ වයස අවුරුදු එකොළහේ දී ඇගේ මව් බිම වන ශ්‍රී ලංකාවේ දී ය. අද අවුරුදු 35 කට පසුවද ඇය තවමත් ක්‍රීඩා පිටියේ දස්කම් පෙන්වමින් උස පැනීම හා දුර පැනීම තරග වලට ඉදිරිපත් වුණේ 2005 ඔක්තෝබර් මස ඇඩිලේඩ් නගරයේ දී ය. එහිදී පැවැත් වූ මාස්ටර්ස් ගේම්ස් තරගාවලියේ අවු 45 - 49 අංශයෙන් ඇය මීටර 1.35 ක් උස පැන රිදී පදක්කමක් ද මීටර 3.95 ක් දුර පැන තඹ පදක්කමක් ද දිනා ගත්තා ය.

2003 කැන්බරා නුවර පැවැත්වීමට යෙදුන මාස්ටර්ස් ගේම්ස් තරගාවලියේ දී දුර දිවීමේ දී 3 වන ස්තානය ද උස පැනීමේ දී 4 වැනි ස්ථානයද දිනා ගන්නට ඇය සමත් වුණා ය.

2006 අප්‍රේල් මාසයේ දී කැන්බරා නුවර පැවැත්වෙන මාස්ටර්ස් ගේම්ස් තරගාවලියේ දී සිය දස්කම් තවත් තයවුරු කිරීම මැණිකේ බන්ඩාරනායක මහත්මියගේ බලාපොරොත්තුවයි.

**නීතා ජයසිංහ**
මවුන්ට් වේවලි




# රවි

ජ්‍යොතිර්විද්‍යා වේදී ගත් කතුවර
**විජයසිරි විද්‍යාරත්න**
**සාකච්ඡා කළා වසන්තා ශ්‍රියාකාන්ති**

ලෝකයේ කොතැනක සිටියත් අපට ග්‍රහ බලපෑමෙන් මිදී ජීවත්වන්නට නොහැකි බව ජ්‍යොතිශාත්‍රඥයෝ පවසති. එහි සැබෑව නිසාම අපද ඒ සඳහා පුංචි නැඹුරුවක් දක්වන බව අමුතුවෙන් කිවයුතු නැත. යම් දුකක් කරදරයක් පැමිණි විට අපේ සිත මුලින්ම දිවයන්නේ අපේ හඳහන වෙතයි. ඒ නිසා අපි ග්‍රහයන් පිළිබඳව සොයා බැලීමට කැමැත්තක් දක්වමු. ග්‍රහයන් පිළිබඳව ඔබම කියවා තේරුම් ගැනීමට හැකිවන සේ ග්‍රහයන් පිළිබඳව විස්තර කරන ලිපි පෙළක ආරම්භයයි මේ.

රවි, ග්‍රහයන්ගේ ලෝකයේ මූලිකයා වේ. එනිසා ලෝකයේ පියා රවිය. රවි උෂ්ණය, එළිය, ආකර්ෂණය, පිරිසිදුකම හා ජීවය දෙයි. හිරු නැතිව මොහොතක්වත් ජීවිත නොපවතී.

හිරු පෘථිවිය මෙන් 330000 වාරයකට වඩා විශාලය.හිරු පොළවේ සිට සැතැප්ම 93000000 දුරින් පිහිටා තිබෙයි. හිරු රැස් පොළවට වැටීමට මිනිත්තු අටක් ගතවෙයි. ක්ෂිතිජයෙන් හිරු සම්පූර්ණයෙන් මතුවීමට මිනිත්තු දෙකක් ගතවෙයි ඉර බැසීමේදී ද සම්පූර්ණයෙන් බැස යාමට ගත වන්නේ මිනිත්තු දෙකකි.

ආදි කාලයේ පටන් ලෝකයා උසස්ම දෙවියා හැටියට සළකා තිබෙන්නේ හිරුය. ජ්‍යොතිෂ ශාස්ත්‍ර සම්බන්ධ කරුණු වල දී හිරු මුල් කොටගෙන ම පටන් ගනිති. ජීව බලය හා රෝග නාශක බලය හිරුගෙන් ලැබෙයි. නිර්භීතකම, දීර්ඝායුෂ, ප්‍රසිද්ධිය, බලය, ක්‍රියාසූරත්වය, ගෞරවය, ශක්තිය, ස්ථිර ප්‍රේමය, සප්‍රානිකභාවය, අවබෝධ ඥානය, චිත්ත ධෛර්යය ආදී සියලු. උසස් ගතිගුණ හිරුගෙන් ලැබෙන බැවින් හිරු ම ප්‍රධාන වෙයි. රවි (හිරු) බලවත්ව සිටින විට ඉහත දේවල් ජීවිත වලට ළඟාවෙයි.

රජුන්ට, රාජ්‍යයට සහ එහි උසස් අයට හිරු බලවත් වෙයි. උෂ්ණ වුණේ වී නමුත් අඟහරු මෙන් සැර නොවෙයි. හිරුගේ රශ්මි චන්ද්‍රයා පිට වැටී-මෙන් සිහිල් වෙයි. මනුෂ්‍ය ශරීරයේ හෘදය වස්තුව, කට, ඇස්, රක්තගාය, ලේ, මොළය, උගුර, ඇල්දිව, ඇට ආදියට අධිපති වෙයි. දවල් උපන් අයට රවි(හිරු) ප්‍රියවෙයි. හිරු ඒ ඒ රාශිවල ගමන් කරන විට ඒ ඒ රාශීන්ගේ ගතිගුණ ප්‍රකට ව පෙනේ.

එනිසා යමෙකු උපදින විට හිරු බලවත්ව කේන්ද්‍රයේ බලවත් ස්ථානයක සිටියේ නම් එම ජීවිතය බලවත් වේ. එමෙන්ම හිරුගේ රැස් හා අන්‍ය සියලූ ග්‍රහයින්ගේ රැස් ද ඇදගෙන පොළවට දෙන්නේ සඳු බැවින් චන්ද්‍රයා ද බලවත් වෙයි.

හිරු සඳු දෙදෙනාගෙන් යමෙකුගේ උප්පත්තිය සම්බන්ධව ප්‍රධාන කරුණු විනිශ්චය කළ හැකිය.

හිරුට ත්‍රිකෝණව හෝ තුන එකොළහේ හෝ සඳු සිටීම යහපත් වේ. හිරු සමග හෝ හතරේ, හතේ දහයේ හෝ සිටීම ශුභ පල අවුල් කරන පිහිටීමකි. මේවා පෝය දවස් වෙයි. ඒ දවස් පුන්‍ය කටයුතු කිරීමට ඈත අතීතයේ සිට ම වෙන් කර තිබෙන්නේ එහෙයිනි.

හිරු සඳු බල අඩුව නරක ස්ථානවල සිටියදී උපන්නවුන්ට මංකොල්ලකාරකම, පහත් අදහස්, වංචල කම, පුහු අහංකාර-කම, කෝපය, ආගිය තැන් නොපිළිගැනීම, චපල හොර හිත ආදිය ඇතිවෙයි.

සඳු උච්ච හෝ ස්වක්ෂේත්‍ර නම් ප්‍රධානත්වය, තේජවන්ත කම, යහපත් එඩිතර කම ඇති වෙයි. කිසිවෙකුට හිස පහත් නොකරයි. ඒ නිසාම ඇතැම් විට උසස් අයගෙන් උදව් ලබා ගැනීමට නොහැකි වෙයි. හිරු නීචවීමද ගුණයකි. සාමාන්‍ය මිනිසා ප්‍රකටව උසස් වෙයි. රජවරු පිරිහෙයි. රජුනට හිරු නීචවීම ගුණ නැත.

හිරු නරක්වීමෙන් බෙල්ලේ ග්‍රන්ථි මහත්වීම, දරුණු රක්තගාය, හෘද රෝග, ලේ දූෂ්‍යවීම, මොළයේ දුර්වලවීමේ රෝග, සිහි අඩුකම, සන්නිපාත ආදී උණ රෝග, මුහුණේ සහ ඇස්වල රෝග සෑදෙයි. ■




